# 11 සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන

සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන 2

- සමගි සන්ධානය
- රෝගීන්ගේ ආලේපය

මෙම දේව ප්‍රසාද නිධාන දෙක තුළින් ම ආධ්‍යාත්මික, ශාරීරික හා මානසික සුවය ලැබේ.

## සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය



11.1 රූපය - පව්කාර ස්ත්‍රිය ජේසුස් වහන්සේගෙන් සමාව ලබා ගැනීම

සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය, ප්‍රසාද ස්නාපනයෙන් පසු පාපයට වැටෙන අයගේ පව් කමාව සඳහා, ස්ථාපිත කර ඇති දේව ප්‍රසාද නිධානය යි. දේව සබැඳියාව පළුදු වන සැම අවස්ථාවක ම සැබෑ පසුතැවිල්ලක් ඇති කර ගෙන, මෙම දේව ප්‍රසාද නිධානය ලබා, නැවත දේව සබඳතාව ඇති කර ගත යුතු ය.

## සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ස්ථාපිත කිරීම

පාස්කු ඉරුදින සැඳෑවේ උත්ථාන වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අපෝස්තුලුවරුන්ට දර්ශනය වී, පහත ශුද්ධ ලියවිලි පාඨයේ සඳහන් වචන පවසමින්, පව් කමා කිරීමේ බලය ඔවුන්ට පවරා, සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ස්ථාපිත කළ සේක.

> ඔබ යමෙකුගේ පව් කමා කරන්නහු ද ඒවා ඔවුන්ට කමා කරනු ලැබේ; ඔබ යමෙකුගේ පව් කමා නොකරන්නහු ද ඒවා කමා නොකරනු ලැබේ
>
> (ජොහන් 20:22-23)



11.2 රූපය - පාපොච්චාරණය කරන අවස්ථාවක්

### සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානයෙන් ලැබෙන වරප්‍රසාද

- ශුද්ධ වූ සභාව (අසල්වැසියන්) සමග සමගි වීම
- සදාතන දඬුවමින් මිදීම
- දෙවියන් වහන්සේ හා සමගි වීම, සිත් සාමය
- යම් ප්‍රමාණයකට කාලීන දඬුවමින් නිදහස් වීම
- ආධ්‍යාත්මික ශක්තිය

ප්‍රසාද ස්නාපනය ලැබුවකු මරණීය පාපයක් කළ සැම විට ම පාපොච්චාරණය කළ යුතු ය. සුළු පාපයකින් පසු පවා මෙම දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමෙන් පව් සමාවත්, පාපයන්ගෙන් වැළකීමට ශක්තියත් ලැබේ. "පව් සමාව" යළි යළිත් පව් කිරීමට දෙන බලපත්‍රයක් නොවේ. සමගි සන්ධානය තුළින් දෙවි සමිඳුන් හා මිත්‍ර වීමට අවස්ථාව ලැබෙන හෙයින් පාපය පිළිකුල් කොට, එයින් ඈත් වන්නට අප ඉටා ගත යුතු ය; දේව වරප්‍රසාද තුළ ජීවත් වීමට එය මගක් කර ගත යුතු ය.

**සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය නිසි ලෙස ලබා ගැනීමට අවශ්‍ය පියවර**

1. තමාගේ පව් සිහි කිරීම
2. ඒවාට දුක් මනස්ථාප වීම
3. මින් මතු පව් නොකරන්නට ඉටා ගැනීම
4. පව් සියල්ල ම පියතුමාට දන්වා සිටීම
5. පියතුමා නියම කරන දඬුවම් ඉටු කිරීම.

## රෝගීන්ගේ ආලේපය




11.3 රූපය - බෙත්සයිදා පොකුණ අසල දී සුව කිරීම

කායික වශයෙන් අප දුබල වන අවස්ථාවන්හි ආධ්‍යාත්මික වශයෙන් ශක්තිමත් කොට, ආත්මික මෙන් ම කායික සුවය දානය කිරීම පිණිස රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය දානය කෙරේ.

## රෝගීන්ගේ ආලේපය නමැති දේව ප්‍රසාද නිධානයෙන් ලැබෙන වරප්‍රසාද

- ★ ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තියේ කොටස්කරුවකු වීම
- ★ වේදනාව දරාගැනීමේ ශක්තිය
- ★ පව් කමාව
- ★ ශාරීරික සුවය
- ★ සදාතන ජීවිතය ලබා ගැනීමට සූදානම් කිරීම.

## රෝගීන්ගේ ආලේපය ලැබිය යුතු අවස්ථා

- ★ කෙනෙකු බරපතළ ලෙස ශාරීරික ව රෝගී වී සිටින විට
- ★ බරපතළ ශල්‍යකර්මයකට පෙර
- ★ වයස්ගත ව දුර්වල වී සිටින විට
- ★ මරණාසන්න මොහොතක
- ★ බරපතළ අනතුරකට පසු ව

## රෝගීන්ගේ ආලේපය ලබා දෙන ස්ථානය සූදානම් කිරීම



11.4 රූපය - රෝගීන්ගේ ආලේපය

ඔබේ නිවසේ රෝගීන්ගේ ආලේපය දානය කරන අවස්ථාවක දී ඉහත සඳහන් ආකාරයට රෝගීන් ආලේප කිරීමේ ස්ථානය සූදානම් කරන්න.

අපගේ අසල්වැසියකු රෝගී ව සිටින අවස්ථාවක ඔහු කතෝලිකයකු නම් මීසමේ පියතුමා දැනුවත් කර, රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය ලබා දීමට අවශ්‍ය කටයුතු කළ යුතු ය. තව ද නිතර නිතර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට අවස්ථාව ලබා දිය යුතු ය. හැකි සෑම අවස්ථාවක ම පාපොච්චාරණය කිරීමට මග පාදා දිය යුතු ය. ඔවුන් වෙනුවෙන් යාච්ඤා කළ යුතු ය.

**ක්‍රියාකාරකම**

**හිස්තැන් පුරවන්න.**

1. "ඔබ යමෙකුගේ ...................... ඒවා ඔවුනට ...................."
2. .......................... ඇති කර ගැනීමෙන් ජීවිත වෙනසක් ඇති කර ගත හැකි ය.
3. රෝගීන්ගේ ආලේපය ලැබිය යුතු අවස්ථා **දෙකක්** ලියන්න.
4. ඔබගේ නිවෙස අසළ සිටින කතෝලික රෝගියකු වෙනුවෙන් පැවරෙන වගකීම් **තුනක්** ලියන්න.



***ජීවිතයට බිඳක්***

***වරදක් කළ හැම විට ම පාපොච්චාරණය කරන්න.***